සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

**නම/විභාග අංකය :-- .................................................................................... කාලය : පැය 3 යි.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

**සැලකිය යුතුයි**

**i.** **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක් ලැබේ.**

**ii.** අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවලදී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

**iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න**

**iv.** එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- **අංක 1සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

1. පාසලේ උත්සවය සඳහා දරුවන්, දෙමාපියන්, ගුරුභවතුන් හා ආදි සිසුන් **ගජරාමෙට** කටයුතු කරනු එහි ගිය අපට දැක ගත හැකි විය.
   1. වගකීමෙන් හා සාර්ථකව
   2. නොසැලකිල්ලෙන් හා අනවධානයෙන්
   3 කැපවීමෙන් හා උනන්දුවෙන්
   4. නොයෙකුත් බාධාවන් මැද

2. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා **හමස් පෙට්ටියට දැමීම** පිළිබඳ විද්වත්හු සිය අප්‍රසාදය පළ කළහ.
   1. ක්‍රියාත්මක නොකොට පසෙකින් තැබීම.
   2. නොකියවා ඉවත දැමීම.
   3. විරුද්ධ වී ඉවත් කිරීම.
   4. පෙට්ටගමක සඟවා තැබීම.

3. අත්වැරදීමකින් සිදු වූ වරදට ඔහු **ඇඟට ගොඩවීම** සමන් කනස්සල්ලට පත් කළ කරුණක් විය.
   1. කෝපයට පත් වීම 2. ගහ මරා ගැනීම 3. දැතේ සවිය පෙන්වීම 4. ආරවුල්වලට පැටලීම

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4. ලේඛකයන් පාඨක ......... වටහා ගෙන සාහිත්‍ය පොත පත රචනා කළ යුතු බව මහාචාර්යතුමා අවධාරණය කළේ ය.
   1. රසිකත්වය 2. රුචිකත්වය 3. ප්‍රබලත්වය 4. ප්‍රවීණත්වය

5. යුද ගැටුම් .................... කිරීම සඳහා ලොව බලවත් රටවල් මහත් පරිශ්‍රමයක් දරමින් සිටී.
   1. සමීක්ෂණය 2. නිරාකරණය 3. නාමකරණය 4. සාමාන්‍යකරණය

6. ''නීති විරෝධී ලෙස තම රටට නො එන්නැ'' යි ඕස්ට්‍රේලියා රජය අනෙකුත් රටවල ............. දන්වා සිටියේ ය.
   1. ආක්‍රමණිකයන්ට 2. විදේශිකයින්ට 3. සංක්‍රමණිකයන්ට 4. නියෝජිතයන්ට

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   1. අනෝදා, අන්නාසි, ගස්ලබු, දූරියන්
   2. ජම්බු, රඹුටන්, පේර, මැංගුස්
   3. වරකා, මොර, කීන, වෙරළු
   4. දොඩම්, මාදං, වීර, කොමඩු

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. ප්‍රතිලාබ, මර්දනය, විමර්ශණ, ප්‍රස්තාවනාව
   2. සමස්ථ, පරිසනක, ඓතිහාසික, සාමාර්ථ්‍යය
   3. නිශ්ප්‍රයෝජන, සූක්ෂ්ම, උත්කෘෂ්ට, පළතුරු
   4. විද්‍යමාන, ඛනිජ, පිළිවෙළ, අලුයම

9. එක් එක් වචනයෙහි තුන් වැනි අකුරේ **දීර්ඝ ඉස්පිල්ල, ගැටපිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදය** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. කීරකොටු, අමෘතය, ප්‍රස්තුතය, මැහැල්ල
   2. සංගීතය, විස්තෘත, සම්පූර්ණ, ගල්ලෑල්ල
   3. මල්හීසර, සංස්කෘත, සරුසාර, කැලෑගම
   4. ත්‍රිපීසියම, අලංකෘත, උතුරන, කරුණාබර

10. දී ඇති වරණ අතුරෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
 1. කුඹුර හැඳින්වීමට වෙල, ලියැද්ද, උබර, කොඹර, ඉස්සර, වගා ඉස්සර, වගා පංගුව යන පද විවිධ පළාත්වලදී යොදා ගනී.
 2. රත්නදීප ජන්ම භූමි ගීතයේ රචකයා ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් ය.
 3. ප්‍රතිභාව යනු තමා විඳින අත්දැකීම් ඇසුරෙන් අපූර්ව සිතිවිලි පහළ කර ගැනීමේ හැකියාවයි.
 4. දුන්න දුනුගමුවේ නාට්‍යය සුගතපාල ද සිල්වාගේ නිර්මාණයකි.

11. උක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
 1. තී, දෙවිවරු, ශිෂ්‍යයෙක්, ගායකයෝ
 2. දෙවඟනක, තොප, ඇතැමෙක්, දරුවා
 3. සමනල්ලු, සංචාරකයෝ, ගොවීහු, කාන්තාවක්
 4. අප, ඇත්තු, භික්ෂුවක්, රෝගීන්

12. ''ප්‍රමාණ + ඉක'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
 1. ප්‍රමාණික
 2. ප්‍රාමාණික
 3. ප්‍රාමණික
 4. ප්‍රමණික

13. දක්ෂයෝ යන පදයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දැක්වූ විට නිවැරදි වරණය කුමක් ද?
 1. දක්ෂ+ඕ
 2. දක්ෂ+යෝ
 3 දක්ෂයා+ඕ
 4. දක්ෂ+අ+ඕ

- **14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

14. ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ මැණික් ව්‍යාපාරිකයකු වූ ඔහුට මැණික් කර්මාන්තය පිළිබඳ තිබූ **හසළත්වය** විස්මය දනවනසුලු ය.
 1. ස්ථාවරත්වය
 2. ප්‍රධානත්වය
 3. ප්‍රමුඛත්වය
 4. නිපුණත්වය

15. **චිරන්තන** සාහිත්‍ය කෘති පරිශීලනයෙන් අපේ උරුමයන් හා ජීවන රටාවන් පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි ය.
 1. සම්භාව්‍ය
 2. නූතන
 3. මධ්‍යතන
 4. පුරාතන

16. 'ට' යනු **මූර්ධජ** අක්ෂරයකි.
 1. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද
 2. දිවේ අග කොටස මුදුන වෙත සමීප වීම නිසා උපදින ශබ්ද
 3. යටිතොල හා උඩු තොල ආධාරයෙන් උපදින ශබ්ද
 4. දිවේ මැද කොටස තල්ල වෙත සමීප වීම නිසා උපදින ශබ්ද

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නො වන පදයක් සහිත වරණය තෝරන්න.
 1. යුගල පද - කසු කුසු, මුදල් හදල්, ආගම දහම, නීති රීති
 2. අසම්භාව්‍ය ක්‍රියා - කියද්දී, පිරුණොත්, ගයන විට, හඬලත
 3. නාම ප්‍රකෘති - කපුටු රිලවා, ගස්, වෙළෙඳ
 4. තද්ධිත - ප්‍රබලතා, ප්‍රකෘතිමත්, සංස්කෘතික, දාර්ශනික

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පේළිය තෝරන්න.
 1. වාච්‍යාර්ථ, වක්‍රෝක්ති, විස්මයාවහ, වාක්කෝෂය
 2. හේන් ඇල්ලීම, අක්වැස්ස, හූ යාදින්න, මහ එකා
 3. ප්‍රේක්ෂකයන්, අභිනය, රංග භූමි, පෙළ
 4. ව්‍යඤ්ජන, උච්චාරණය, අඝෝෂ ශබ්ද, සඤ්ඤක අක්ෂර

19. මුලින් දැක්වෙන අක්ෂරවර්ගයට අයත් අක්ෂරයක් නොයෙදුණු වචනය සහිත වරණය තෝරන්න.
 1. අන්තඃස්ථාක්ෂර- සමාජය, සරුංගලය, වත්කම, තත්සම
 2. අඝෝෂ - තත්පරය, පිල්ටරය, විශේෂ, කරුණාව
 3. සඤ්ඤක - නිලඹර, අඟහරුවාදා, පිළිබඳ, මඬුල්ල
 4. මහාප්‍රාණ - අවස්ථාව, ප්‍රතිඵල, සුඛෝපභෝගී, අරහයා

20. මුලින් දී ඇති පදයට සමානාර්ථ යෙදුම් පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
 1. සඳ - චන්ද්‍රයා, උළිඳු, නිසයුරු, දිවාකර
 2. අනංගයා - කම්පස, මින්දද, මලවි, මල්සර
 3. තුරු - පාදප, වනස්පත, ධූම, භූපති
 4. මෝඩ - මුග්ධ, නූගත්, ව්‍යක්ත, අඥාන

21. විරුද්ධාර්ථ පද යුගලයක් නොවන වරණය තෝරන්න.
 1. අවමන් බුහුමන්
 2. රෝගකාරක රෝග නාශක
 3. ස්ථාවර ජංගම
 4. සූක්ෂ්ම සියුම්

22. විධික්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
1. ඔබ පොළවට බරකි පුතේ
2. මැටි භාරන්න බැස ගත්තේ වළ තුළට
3. කියග මගිය එනු කොහි සිට
4. මෙසේ ඇයි නඟනු අම්මේ මඳ හාස?

23. වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.
1. කර්තෘකාරක වාක්‍යය අනුක්ත ව තබන කර්මය, කර්මකාරක වාක්‍යයක උක්ත ව තබයි.
2. විජයබා කොල්ලය ඩබ්ලිව්. ඒ සිල්වා මහතාගේ ඓතිහාසික නවකතාවකි.
3. නාට්‍ය ශාස්ත්‍රය නම් කෘතිය ඇරිස්ටෝටල් නම් පඬිවරයාගේ කෘතියකි.
4. සිංහල අක්ෂර මාලාවේ ඇති ''ෆ'' අක්ෂරයෙන් ඉංග්‍රීසි හා අරාබි භාෂාවන්හි දක්වෙන ෆ් ශබ්දය නිරූපණය වෙයි.

24. ඕෂ්ඨජ අක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.
1. ප, ට, ඉ, ග, උ
2. උ, ම, ප, ෆ, බ
3. ක, ග, ෆ, ද, ර
4. ප, ග, ච, ට, හ

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් සාදාගත හැකි කොළඹ කවීන්ගේ නාමය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.
1. ලිමඩකුග
2. මාංහසින
3. පළුන්දර
4. ගසේකම

- **අංක 26 හා 27 තෙක් ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.**

26. අටුව කඩා පුටුව හැදුවා වගෙයි.
1. නිෂ්ප්‍රයෝජන කටයුත්තක් කිරීම
2. සුළු ප්‍රයෝජනයක් සඳහා වටිනා දෙයක් විනාශ කිරීම
3. වඩා ඵලදායී කටයුත්තක් කිරීම
4. අරමුණ නො දන කටයුතු කිරීම

27. අඬුව තිබෙද්දී අත පුළුස්සා ගත්තා වාගේ.
1. වටිනා දෙයක් තිබියදී නො වටිනාදේ ගැනීම
2. උත්සාහය අතහැර කරදරයට පත්වීම
3. පහසු මගක් තිබියදී දිගු මගකින් යාම
4. අවශ්‍ය උපකරණ භාවිත නො කොට විපතට පත් වීම

28. A - සබවස - අභ්‍යවකාශය
B - විස්මයාවහ - සැක සහිත
C - කැළණි පාලම - ආර්. ආර්. සමරකෝන්
D - උවම් - උපමා
A, B, C, D යෙදුම් අතරින් නිවැරදි යුගල වන්නේ,
1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. C හා D පමණි.

- **29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. 1. ආචාර්ය පණ්ඩිත් අමරදේව ප්‍රවීණ සංගීතඥයකු විය.
2. ගොවීන් පස් දෙනෙක් සාකච්ඡාව සඳහා සහභාගී වූහ.
3. ඔහු විනීත ශිෂ්‍යයෙක් ලු.
4. ගුරුවරු සිසුන් පිළිබඳ ව සොයා බලනු ඇත.

30. 1. නීතිය හා සාමය සුරකින්නන් ආදර්ශවත් විය යුත්තෝ ය.
2. සභාතොමෝ සතුටින් විසිර ගියා ය.
3. ගොවීහු ස්වාභාවික පොහොර භාවිත කිරීම වටී.
4. අපි විභාගය ජයගන්නේ කෙසේ ද?

31. A මැටි කාර්මිකයා සොබා දහම .................. ඉතා සමීපව දිවි ගෙවීය.
B දේශානුරාගය යනු තම මාතෘ භූමිය .................. ඇති ඇල්මය.
C කන්නංගර මහතා ගණිතය පිළිබඳ ගුරුවරයකු .................. වෘත්තිය ජීවිතයට ප්‍රවිෂ්ට විය.
D ප්‍රතිභාව වූකලී අත්දැකීම් යළි යළිත් සිහි කිරීමෙන්..................... පරිකල්පනයෙන් පෝෂණය ලබන්නකි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E ලෙස F නැතහොත් G කෙරෙහි H සමග
1. H,G,E,F
2. H,G,F,E
3. G,E,F,H
4. H,F,E,G

32. පහත දක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒ අස්සෙ මහ සෙනගක් එතනට රැස් වුණා''
1. ඒ වෙලාවෙ එහි මහ සෙනගක් රැස් විය.
2. ඒ අතර විශාල සෙනඟක් එහි රැස් විය.
3. මේ අතරේ විශාල සෙනගක් රැස්වූවා ය.
4. ඒ අතර මහ සෙනගක් රැස් වුණි.

33. මියගිය උවැසිය නමැති පද්‍ය නිර්මාණය
   1. ගුණදාස අමරසේකරගේ ය.   2. මහගම සේකරගේ ය.
   3. රත්න ශ්‍රී විජේසිංහගේ ය.   4. විමල් දිසානායකගේ ය.

34. **රූපකයක් රහිත** වරණය තෝරන්න.
   1. සැඳෑ සඳුට සඳමින් මග නිසා කත   2. දිනිඳු හිමි විලඹුවෝ
   3. නිල් කුරුලු බිළිඳු නිදි ඇහැරවන්නේ කුමට   4. මෙවුල් දම බමර කිකිණි.

35. 'සුනේත්‍රාගේ හඬින් සේනාධීරගේ සිතෙහි ඇති වන ප්‍රහර්ෂය අවට පරිසරයේ වර්ණනා කිරීමෙන් කූළු ගන්වයි.' යන වාක්‍යයේ 'ප්‍රහර්ෂය' යන වචනයේ අර්ථය කුමක් ද?
   1. අධික තැතිගැන්ම   2. අධික උත්සාහය   3. අධික පුදුමය   4. අධික සන්තෝෂය

36. පහත සඳහන් කවියේ දෙ වැනි පදය තෝරන්න.

   නන්නාඳුනන මෙනුවර තනිවුන අපට
   ..........................................................................
   වන්දෝ බිළින්දෝ නාඬා නැළවෙන්න
   යම් දෝ හෙට උදේ අපි අපසු ගමට

1. දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට   2. ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට
3. අම්මා ඇවිල්ලා හීනෙන් දොරකොඩට   4. ඇහුවා මගෙ පුතේ කිරි ඕනෙ ද නුඹට

37. ''අපිත් දන්නව ඔහේගෙ සෙප්පඩ විජ්ජා. අපි දැක්ක අර පැත්තෙන් හම්බ වුණු පොදිය'' මෙම සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?
   1. ගුරු තරුව   2. කැලණි පාලම   3. හුණුවටයේ කතාව   4. සිංහබාහු

38. හේන් ගොවිතැන ආශ්‍රිත භාෂාව්‍යවහාරයේ දී අක් වැස්ස යනු,
   1. හේන් ගිනිලෑමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව ය.   2. හේන වැපිරීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව ය.
   3. අස්වනු නෙළීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව ය.   4. හේන කෙටීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව ය.

39. රුක් අත්තන පෙතන් පලු බෝ මී කහට
   බක් මී දිවුල් කොළ බෝ දාඹු මී බට
   හික් දඹ ලෝලු කොබ්බෑ කුරටි දෙමට
   අත්වල අත අල්ලනු මරු මුවා කොට
   යන කවියෙන් කියැවෙන්නේ,
   1. හේන් කෙටීමේ දී නොකැපිය යුතු ගස් පිළිබඳව ය.
   2. හේන් කෙටීමේ දී අනිවාර්යයෙන් ම කැපිය යුතු ගස් පිළිබඳව ය.
   3. හේන් කෙටීමේ දී කැපීමට අපහසු ගස් පිළිබඳව ය.
   4. හේන් කෙටීමේ දී පළමුව කැපිය යුතු ගස් පිළිබඳව ය.

- **පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

40. ලෝකයේ දියුණු රටවල් ආදර්ශයට ගෙන ක්‍රමවත් ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවුව හොත් කසළ විපත් ගෙන දෙන්නක් නොව මහා සම්පත් ලබා දෙන්නක් බවට පත් කිරීම අසීරු නොවේ.
   1. අප කසළ ගැටලුවට විසඳුම් සෙවීමට නම් ලෝකයේ දියුණු රටවල ආධාර පැතීම අනිවාර්යයෙන් කළ යුතු ය.
   2. ලොව දියුණු රටවලට ද ආදර්ශයක් වන පරිදි කසළ ගැටලුවට විසඳුම් සෙවීමට අප රටට හැකි වී තිබේ.
   3. ලොව දියුණු රටවල් මෙන් කසල විධිමත් ව ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් ඉන් වාසි ලබා ගැනීමට ද හැකි ය.
   4. සියලු විපත් වළක්වා ගැනීමටත් සම්පත් ලබා ගැනීමටත් කසළ විධිමත් කළමනාකරණයෙන් හැකි වේ.

(ලකුණු 1 x 40 = 40යි)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

නම/විභාග අංකය :-- ..................................................................................

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

♦ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) දරන (ආ) දරණ

(ii) පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක **පමණක්** නිදොස් කර ලියන්න.

''බටහිර අහාෂයේ පෝෂණ රටාවට වඩා පැරණි ලාංකේය ශිෂ්ඨාචාරයේ පෝෂණ රටාව සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහිකරයි.''

(iii) ''රන් කරල් නමා නමා
සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නේ උන් හෙළු ප්‍රාණ වායුවයි'' මෙම උද්ධෘතයෙන්,

(අ) මූර්ධජ අක්ෂර දෙකක් ද

(ආ) අන්තඃස්ථාක්ෂර දෙකක් ද ලියා දක්වන්න.

(iv) පහත සඳහන් තද්ධිත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(අ) නාගරික (ආ) පෞද්ගලික

(v) ''නටයි'' යන ක්‍රියා පදයෙන්,

(අ) අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා පදයක්

(ආ) මිශ්‍ර ක්‍රියා පදයක් සකස් කර ලියන්න.

(vi) පහත සඳහන් (අ) හා (ආ) යටතේ දැක්වෙන අදහස්වලට තනි පදය බැගින් ලියන්න.

(අ) භාෂාවෙහි ශබ්ද හා අර්ථ විග්‍රහ කර දක්වන ශාස්ත්‍රය

(ආ) කාලයක් තිස්සේ උගත් කරුණු නැවත සිහි ගැන්වීම

(vii) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) දරුවෝ ගුරු දෙගුරුන්ට කීකරු වීම මැනවි.

(ආ) ලාංකිකයෝ සාමය ළඟා කරගන්නේ කවදා ද?

(viii) පහත සඳහන් පදවලට සමානාර්ථ පදයක් බැගින් ලියන්න.

(අ) පිළිලද සංවේග

(ආ) ඉදුහ බලයෙන්

(ix) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ශ්‍රී ලාංකිකයෝ දෙදෙනෙක් ''රාවණාවන්'' චන්ද්‍රිකාව අභ්‍යවකාශගත කිරීමට සමත් වූහ.

(ආ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කිරීම සඳහා නව තාක්ෂණික මෙවලම් භාවිත කරති.

(x) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා යෙදෙන පොදු ව්‍යවහාරය ලියන්න.

(අ) අඹනවා (ආ) අත්තප්පා (ලකුණු 2 x 10 = 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) වනාන්තර සංහාරය මිනිස් ජීවිතයට තර්ජනයක් වුව ද මේ වන තෙක් වන සංහාරයේ අඩුවක් නැත. මේ නිසා වන සතුන්ට ඔවුන්ගේ වාසස්ථාන අහිමි වීමත් විශේෂයෙන් අලි මිනිස් ගැටුමක් නිතර නිතර අසන්නට, දකින්නට ලැබෙන සිද්ධියකි. කාලාන්තරයක් තිස්සේ මෙරට පවතින අලි මිනිස් ගැටුම හේතුවෙන් අලින්ගේ සහ මිනිසුන්ගේ ජීවිත මෙන්ම දේපළවලට ද සිදුවන හානිය ගණනය කළ නොහැකි තරම් ය. මිනිස් ක්‍රියාකාරකම් නිසා අලි සම්පතට වන හානිය හද කම්පා කරවයි. එම නිසා අලි මෙරටට වටිනා සම්පතක් බවට පත් කර ගැනීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට කාලය එළඹ ඇත.

(ආ) විවිධ ජනවර්ග වාසය කරන ඕස්ට්‍රේලියාව වැනි ලෝකයේ බෝහෝ රටවල් සහජීවනයෙන් ජීවත් වන ආකාරය අපි අසා ඇත්තෙමු. තිස් වසරක යුද්ධයකට මුහුණ දුන් ශ්‍රී ලංකාව සමාජ ආර්ථික වශයෙන් පීඩනයට පත් වූ රටකි. බොහෝ ජන වර්ග සංඛ්‍යාවක් නොමැති ශ්‍රී ලංකාව නැවතත් වාර්ගික ආගමික ගැටුමකට මුහුණ දී ඇති බව පසුගිය කාලවකවානුවේ වුණු සිද්ධි සාක්ෂි දරයි. අද ජාතීන් අතර සහජීවනය යන්න වචනයකට පමණක් සීමා වී ඇත. අතීත ශ්‍රී ලාංකිකයා සහයෝගයෙන් ජීවත් වූ බවට වෙනත් ජාතීන් ගායනා කළ අදටත් ජනප්‍රිය බෞද්ධ ගීත අපට අමතක නොවේ. ජාති කුල මල ආගම් යන හරසුන් දේ හැර මනුෂ්‍යයත්වයේ නාමයෙන් ලාංකේයන් ලෙස පෙළ ගැසෙමු.

(ඉ) පුද්ගලයා දැනුමෙන් පරිපූර්ණත්වයට පත් වන්නේ සාහිත්‍ය පොතපත පරිශීලනයෙනි. තාක්ෂණික ලෝකයේ තාක්ෂණික මෙවලම් අතර පාසල් දරුවන් ද ඇතුළුව වර්තමාන පරම්පරාව ක්‍රමයෙන් සාහිත්‍ය පොතපත පරිශීලනයෙන් ඈත් වෙමින් සිටිති. සිය ගණන් පොතපත පළ වුව ද, සාහිත්‍ය සම්මාන උළෙල පැවැත් වුව ද කියවීම් මාසයක් හා පොත් සල්පිල් පැවැත්වුව ද කියවන පිරිස සීමිත ය. මේ තත්ත්වය රටේ අනාගතය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපායි. හීන ආකල්පයන්ගෙන් පිරි මිනිස් සමාජයක අනාගතය කෙබඳු වෙයි ද? පූර්ණ ආකල්ප හා ගුණ ධර්ම පිරි සමාජයක් බිහි කිරීමට නම් පොතපත අපේ මිතුරා විය යුතු ය.

(ඊ) මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතය වර්තමානය වන විට බහුලව දක්නට ලැබෙන්නකි. ජනප්‍රිය වූ දුම්වැටියෙන් තරුණ පරපුර ඈත් වුව ද, ඊට වඩා භයානක මත් ද්‍රව්‍යවලට තරුණ පරපුර ඇබ්බැහි වී සිටිති. මෙය මැඩ පැවැත්වීම සඳහා රජය කිලෝ ගණන් මත් කුඩු අත්අඩංගුවට ගෙන විනාශ කළ ද, භාවිතයේ අඩුවක් නැත. මත් ද්‍රව්‍ය නිසා පවුල් සංස්ථාව බිඳ වැටීම, ලෙඩ රෝගවලින් පෙළීම, ඝාතකයන් බහුල වීම සමාජයේ පැවැත්මට අහිතකරය. නීති රීති මගින් පමණක් නවතාලිය නොහැකි මත් ද්‍රව්‍ය උවදුර ආකල්පමය වශයෙන් වෙනසක් කිරීමට පවුල, පාසල, පන්සල, කෝවිල පාදක කර ගනිමු.

03. පහත සඳහන් ඡේදය වචන 55 ත් 65 ත් අතර වන සේ සාරාංශ කර ලියන්න. (ඔබ යෙදූ වචන ගණන සාරාංශයේ අග ලියන්න)

අතීතයේ ගුරු කේන්ද්‍රීයව පැවති ඉගෙනුම් ක්‍රියාවලිය ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාවලියක් බවට පරිවර්තනය වී ඇති, වර්තමානයේ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා නිර්මාණය වී තිබීම නිසා අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම් ආධාරක ඉගෙනුම් ආධාරක ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීම අත්‍යවශ්‍ය අංගයක් බවට පත් ව තිබේ. එසේ සිසු පැවරුම් සඳහා උපයෝගී කර ගත හැකි තොරතුරු, පින්තූර, සටහන්, ඡායාරූප, වගු, සිතියම්, ප්‍රස්තාර ආදී ඉගෙනුම් සම්පත් ඉතා විශාල සංඛ්‍යාවක් අන්තර්ජාලයේ මෙන් ම ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධති තුළ ඇතුළත් ව පවතී. සිසුන් විසින් සිදු කළ යුතු වන්නේ අදාළ තොරතුරු ලබාගැනීම සඳහා නිවැරදි ව ක්‍රමවත් ව අන්තර්ජාලය භාවිත කිරීමයි. ඒ සඳහා අදාළ වන සෙවුම් යන්ත්‍ර අන්තර්ජාලයේ අඩංගු වන අතර ඒවා මගින් තම අවශ්‍යතාව අනුව තොරතුරු සොයා ගැනීම සිදු කළ යුතු ය. ඒ සඳහා සෙවීමට අවශ්‍ය තොරතුරේ ස්වභාවය මත නිවැරදි වචන භාවිත කරමින් සෙවීම සිදු කළ යුතු ය.

එසේ ම විවිධ රටවල නිර්මාණය කරන ලද ඉගෙනුම් මෘදුකාංග ද ඒ ඒ විෂයනට අදාළ ව අන්තර්ජාලය තුළ අන්තර්ගත ව පවතින අතර ඒවා ද අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා උපයෝගි කර ගැනීමේ හැකියාවක් පවතී. අවශ්‍ය වන්නේ නව තොරතුරු සෙවීමේ උනන්දුව හා ඒ සඳහා පවතින ප්‍රමාණවත් පහසුකම් පමණි. මේ සඳහා නිවසේ පරිගණකයක් තිබීම ම අත්‍යවශ්‍ය නො වන අතර ගුරුවරුන්ගේ අධීක්ෂණය යටතේ පාසලේ පවතින පහසුකම් භාවිත කරමින් අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීම සිදු කළ හැකි ය. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේද කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වැදගත් වන්නේ ජන කණ්ඩායම් අතර පවතින ජන නිර්මාණයන් අධ්‍යයනයට හසුකර ගැනීමයි. මේවා ජනශ්‍රැති යනුවෙන් හඳුන්වනු ලැබේ. ජනශ්‍රැතිවලට අයත් වන්නේ ජනකතා, ජනකවි, ජනක්‍රීඩා, ජන ඇදහිලි, ජන ආගම්, සිරිත් විරිත් යනා දී අංගයන් ය. ජනශ්‍රැති අංග මානව සමාජය තුළ ජනතාවගේ උන්නතිය සඳහා උපකාර වන්නා සේ ම සමාජ යථාර්ථයන් නිර්මාණාත්මක හඳුන්වාදීමට ද උපකාරී වේ. නිදසුනක් ලෙස ජනකවියා තම ජීවිතයේ ලද අත්දැකීම් සරල බස් වහරකින් නිර්මාණාත්මක කවියක් ලෙස ඉදිරිපත් කෙළේ ය. එය සන්නිවේදන සාහිත්‍ය පෝෂණය කිරීම සඳහා ද ඉවහල් විය. මානව විද්‍යාඥයින් ප්‍රකාශ කරන්නේ ජනශ්‍රැති අංගෝපාංගයන්ගෙන් තොර නිර්මාණාත්මක සන්නිවේදනයක් දැකගත නොහැකි බවයි. මෙය ලෝකයේ විවිධ රටවල සාහිත්‍ය පොතපත පිළිබඳ විශ්ලේෂණය කරන විට පැහැදිලි ය.

චීන සාහිත්‍යයේ ලක්ෂණ පරීක්ෂා කර බලන විට පැරණි කතා යොදා ගනිමින් කාව්‍ය, නාට්‍ය මෙන් ම සිනමා කෘතීන් ද නිර්මාණය වී තිබේ. සෙවන් සමුරායි වැනි චිත්‍රපටවල අන්තර්ගත වන්නේ එබඳු ලක්ෂණයන් ය. ග්‍රීක සාහිත්‍යය තුළ ද මෙවැනි ලක්ෂණ දක්නට ලැබේ ඊසොප්ගේ උපමා කතා ලෝකයේ ජනප්‍රිය නිර්මාණයක් ලෙස සලකනු ලැබේ. හෝමර් නැමැති කවියාගේ ඉලියඩ් සහ ඔඩිසි වැනි නිර්මාණ ලෝක ප්‍රකට ජන නිර්මාණ ලෙස සැලකේ. ඉන්දියානු සාහිත්‍යයේ පංචතන්ත්‍රය, හිතෝපදේශය වැනි ග්‍රන්ථයන් ද වාල්මිකීගේ රාමායණය, මහා භාරතය වැනි කෘතීන් ද නිර්මාණාත්මක සන්නිවේදනයේ ප්‍රතිඵලයන් ය. ශ්‍රී ලංකාවේ ජාතක පොත, ජනකවි, ජනකතා යනාදිය ද නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ විදහාපායි. මෙයින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ එබඳු රටක වුව ද පොදු ජනතාව අතර පවතින නිර්මාණය වර්තමානයේ දී පවා ජනප්‍රිය වී ඇති බවයි.

(i) ජනශ්‍රැතිය යනු කුමක්දැයි හඳුන්වා, ජනශ්‍රැති අංග දෙකක් ලියන්න.

(ii) ජනශ්‍රැති පිළිබඳව මානව විද්‍යාඥයින්ගේ අදහස කුමක් ද?

(iii) ග්‍රීක හා ඉන්දීය සාහිත්‍යය තුළ නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ පෙන්වන කෘති දෙක බැගින් ලියන්න.

(iv) අද වන විට පවතින ජනප්‍රිය සාහිත්‍යාංගවල නිර්මාණකරුවා වන්නේ කවුද?

(v) පහත සඳහන් වචනවල තේරුම ලියන්න. (ලකුණු 2 x 5 = 10යි)

(අ) උන්නතිය

(ආ) හිතෝපදේශය

05. පාසල් පද්ධතිය ආරක්ෂිත ව පවත්වාගෙන යාමේ දී ඒ පිළිබඳ වගකීම විදුහල්පති, ගුරුභවතුන්, දෙමාපියන් මෙන් ම සිසුන්ට ද පැවරී ඇත. මඟ තොට ගමන් කිරීමේදීත්, තම වටපිටාවේත් ආරක්ෂාව පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවකි. එවන් දැනුම්වත් කිරීමේ දේශනයක් පවත්වන ලෙස ආරාධනා කරමින් ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමාට යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. ඔබ පහන්ගම මහා විද්‍යාලයේ සමාජ විද්‍යා සංගමයේ ලේකම් නුවන් උඩුකුඹුර යයි සිතන්න.

(පිළිතුරෙහි වචන 100ක් පමණ ප්‍රමාණවත් වේ.)

නැතහොත්

වාර්ෂිකව ඔබ පාසලේ පැවැත්වෙන වින්දන කලා උළෙල 2019. 10. 12 පෙරවරු 10.00 ට විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට නියමිතව ඇතැයි සිතන්න. එහි ප්‍රධාන දේශනය පැවැත්වීම සඳහා කාව්‍ය සංග්‍රහ මෙන්ම ජනප්‍රිය ගීත රැසක් නිර්මාණය කොට බුන්කා සම්මානයෙන් පුද ලද රත්න ශ්‍රී විජේසිංහ සාහිත්‍යධරයන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. ඔබ පාසලේ වින්දන කලා කේන්ද්‍රයේ ලේකම් සමිත මහානාම යැයි සිතන්න (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 02 යි**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි.**

01. (I) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) අප බෝසතුන් මිස
අනෙකකු නොම අසන ලෙස
.......................................................
තත් සිඳුව යි කී ය එ විගස

(අ) මෙහි ඉතිරි පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.
(ආ) බෝසතුන්ට ලැබුණු පණිවිඩය කුමක් ද?

(ii) (අ) ''ධර්ම යුද්ධයක්'' පැවැත්විය යුතු යැයි යෝජනා කළේ කවුරුන් ද?
(ආ) ධර්ම යුද්ධය යනුවෙන් අදහස් කළේ කුමක් ද?

(iii) ''සීයෙ මම බොහොම කරදර විඳගෙන ආවෙ එයා හොයාගෙන''
(අ) මෙහි ''සීයෙ'' යන ඇමතුම ලැබුවේ කවු ද?
(ආ) එයා යනුවෙන් මෙහි සඳහන් කර ඇත්තේ කවුරුන් පිළිබඳව ද?

(iv) ''පින්වත්නි, අටළොස් අක්ෂෞහිණියක් පමණ මේ සේනාව ගෙන වුත් තමන්ගේ නුවර වටලා ගත් නියාවට කිසි භයක් වත් තැති ගැන්මක් වත් නැත්තේ ය.''
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුද් ?
(ආ) මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

(v) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළියට දැක ගිනි හුල දියේ හෙලා
අනුන් ලියක් දැක තම ලියට තල තලා
.......................................................................

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවියේ සඳහන් අනුවණ ක්‍රියා දෙකක් ලියන්න.

(vi) කැර මිණි බරණ රැස්
රැසින් සුර සැවු සුවහස්
(අ) ඉහත පද්‍ය ඛණ්ඩය ඇතුළත් පද්‍ය ග්‍රන්ථය රචනා වූයේ කුමන සාහිත්‍ය යුගයක ද?
(ආ) මෙම පද්‍යයේ කියැවෙන පරිදි සැරසී සිටියෝ කවරහු ද?

(vii) (අ) අලිඛිත සාහිත්‍යාංගයක් වූ ජන කවි සාහිත්‍යය මේ දක්වා පවත්වා ගෙන පැමිණියේ කෙසේ ද?
(ආ) පැරණි ගැමියන් දෙවොල් මඩු, ගම් මඩු හා කෝල් මුර කවි ගායනා කළේ කුමන අරමුණක් වෙනුවෙන් ද?

(viii) ''උඹ කඹුරුපිටියට ගිහින් ඒජන්ත හාමුදුරුවන්ට පෙත්සමක් දීපන්''
(අ) මෙම ප්‍රකාශය කළේ කවු ද?
(ආ) ''උඹ'' යනුවෙන් ඇමතීම ලැබුවේ කවු ද?

(ix) (අ) උම්මග්ග ජාතක කතාව රචනා කිරීමේ අරමුණ කුමක් ද?
(ආ) පණිවිඩය රැගෙන ආ ගිරා පෝතකයාට මහෞෂධ පණ්ඩිතයන් කළ සත්කාර දෙකක් ලියන්න.

(x) සිතිවිලි නැති රූ විලස මුවෝ යා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා
(අ) මෙහි සඳහන් උපමාවක් ලියන්න.
(ආ) 'සමුවෝයා' යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 02 x 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) බෝධිසත්ත්වයන් වහන්සේ ද සතුරන් ආ දවස් විධානයක් කරන සේක් ''යමෙක් ඊදණ්ඩක බැඳ විද පී පතක් දුටුයේ වී නම් වහා ගෙන වුත් මට දෙව'' යි වදාළ සේක.
(අ) අංකිත පදවල තේරුම ලියන්න.
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii　පිය සන් නො ව <u>බිඟු දූල්</u> රැඳි　　කොපුලී
අවසන් නො ව වෙණ නදට ම　　කුහුලී
මද සන් සුන් <u>පියොවින්</u> සිටි　　නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි　　කියෙලී
(අ)　අංකිත පදවල තේරුම ලියන්න
(ආ)　අවසන් පද්‍ය පාද දෙකෙහි අර්ථය ලියන්න.

iii　බිස්සේ තිබුණු කුරක්කන් ටික ඉක්මනින් ම ඉවරව ගිය හෙයින් කෑ හැකි කොළ වර්ග, අල වර්ග හා පලතුරු ද සෙවීමට ඈ වනයට ගියා ය.
(අ)　'බිස්ස' යන වචනයේ තේරුම ලියන්න.
(ආ)　මෙම උද්ධෘතයෙන් කියවෙන චරිතයට මුහුණ දීමට සිදු වූ ගැටලු දෙකක් ලියන්න.

iv.　ඇස නැති දා පොත ගත්තේ　　කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි　　තපින්ට ද
<u>වෙර</u> නැති දා ගහ ගත්තේ　　දිනන්ට ද
යුද ඇති දා නැති <u>කුග</u> කොස්　　කොටන්ට ද
(අ)　අංකිත පදවල තේරුම ලියන්න.
(ආ)　මෙම කවියෙන් ජීවිතයට ලබා දෙන ආදර්ශය කුමක් ද?

v.　''ආචාරිනී, නුවර ගන්නා තබා පවුර ළඟට යන්නටත් සමර්ථ එක ද සත්ත්වයෙක් නැති''
(අ)　මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ආ)　මෙහි සඳහන් පවුර අයත් රාජධානිය කුමක් ද?　　(ලකුණු 4x5=20)

03.　(i) බෝධිසත්ත්ව චරිතය විශිෂ්ටත්වයෙන් යුතුව ද
(ii) බමුණු සමාජය උපහාසයෙන් යුතුව ද නිරූපණය කිරීමට ජාතක කතාකරුවා දක්වා ඇති නිපුණතාව සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

ගුත්තිල ආචාර්යවරයාගේ වීණාවේ මිහිර
(i)　සත්ත්ව චරිත පාදක කරගනිමින්
(ii)　විවිධ විරිත් භාවිතයත්
මනාව සංකලනය කර ගැනීමට සමත් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

04.　බැද්දේගම කතුවරයා එහි වැසියන්ගේ
(i)　නූගත්කමත්
(ii)　පරිසරය හා පුද්ගලයා අතර ඇති බැඳීමත්
අනුකම්පාවෙන් යුතුව ඉදිරිපත් කිරීමට සමත් වී ඇත්තේ කෙසේද යි එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

(i)　ගැමි අත්දැකීම් ප්‍රකාශනයටත්
(ii) කට වහර භාවිතයටත්
ජනකවියා සතු අපූරු කුසලතාව ''හානා හීය පානා අඬහැරෙන් දූනේ'' පද්‍ය පන්තියෙන් ප්‍රකට වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.　　(ලකුණු 15)

05.　බෝසත් චරිතය ඉස්මතු කර දැක්වීමට ජාතකකතාකරුවාගේ අරමුණයි. සතර කන් මන්ත්‍රණය පාඩමෙන් නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න.

06.　උපදේශාත්මක ජනකවිවල අන්තර්ගත අදහස් වර්තමාන සංකීර්ණ සමාජයට ද මනාව ගැළපේ. 'හානා හීය පානා අඬහැරෙන් දූනේ.' පාඩමෙන් නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

07.　බැද්දේගම නවකතාවේ පුංචි මැණිකා දිරිමත් හා ආදර්ශවත් කාන්තාවකි. නියමිත කොටසින් සුදුසු නිදසුන් තුනක් දක්වමින් විමසන්න.　　(ලකුණු 10)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 3 | 2. 1 | 3. 4 | 4. 2 | 5. 2 | 6. 3 | 7. 1 | 8. 4 | 9. 2 | 10. 2 |
| 11. 3 | 12. 2 | 13. 1 | 14. 4 | 15. 4 | 16. 2 | 17. 3 | 18. 1 | 19. 1 | 20. 2 |
| 21. 4 | 22. 3 | 23. 3 | 24. 2 | 25. 1 | 26. 2 | 27. 4 | 28. 4 | 29. 3 | 30. 2 |
| 31. 1 | 32. 2 | 33. 4 | 34. 3 | 35. 4 | 36. 2 | 37. 3 | 38. 1 | 39. 4 | 40. 3 |

### II පත්‍රය

01. (i) (අ) දැරීම යන අර්ථය තිබිය යුතුය (දරනවා)
(ආ) දඟර ගැසුණු, දරණ ගසනවා, (සර්පයකු) දරණුව
(ii) (අ) අභාසයේ (ආ) ශිෂ්ටාචාරයේ
(iii) (අ) ඓ, ඖ (ආ) ය, ර, ල, ව
(iv) (අ) නගර+ඉක (ප්‍රත්‍ය) (ආ) පුද්ගල+ඉක (ප්‍රත්‍ය)
(v) (අ) නැටුවොත් / නැටුවහොත් (ආ) නටමින් / නට නටා
(vi) (අ) ව්‍යාකරණය (ආ) පුනරීක්ෂණය
(vii) (අ) දරුවන් ගුරු දෙගුරුන්ට කීකරු වීම මැනවි
(ආ) ලාංකිකයන් සාමය ළඟා කරගන්නේ කවදා ද?
(viii) (අ) අවබෝධයෙන් යුක්තව (ආ) ඍද්ධි බලයෙන්
(ix) (අ) ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකු විසින් රාවණාවන් චන්ද්‍රිකාව අභ්‍යාවකාශ ගත කිරීමට සමත් වන ලදී / ලැබිණි./ සමත්විණි/සමත්වන ලද්දේ ය.
(ආ) වෛද්‍යවරුන් විසින් රෝගීන් සුවපත්කිරීම සඳහා නව තාක්ෂණික මෙවලම් භාවිත කෙරේ /කරනු ලැබේ /කරනු ලබයි
(x) (අ) එළවනවා, පන්නනවා, ලුහුබැඳ යනවා (ආ) සීයා / තාත්තාගේ තාත්තා

02. රචනය (ලකුණු 25)
සාරවත් භාවය (මාතෘකාවද ඇතුළුව) (ලකුණු 08)
සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය (ලකුණු 12)
(මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය නිර්මාණාත්මක ප්‍රකාශය, ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුයි)
ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම (ලකුණු 05)
(මෙහිදී වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය ඡේද අදාළ පරිදි වෙන් කර ලිවීම පද වෙන් කර ලිවීම යන අංශ ගැන සලකා බැලිය යුතුය)

03. සාරාංශය (ලකුණු 10)
කරුණු 6 ට (ලකුණු 6)
වචන ගණනට (ලකුණු 2) (වචන 45 ට අඩු හා 65 ට වැඩි වූ විට 1 ලකුණක් අඩු කරන්න.)
ශිල්පීය දක්ෂතා (ලකුණු 2)
(ඡේද වෙන් කර ඇත්නම්, අක්ෂර වැරදි නම් 1 ලකුණකි)

04. i. ජනශ්‍රැති යනු ජන කණ්ඩායම් අතර ඇති ජන නිර්මාණයන් ය. ජනශ්‍රැති අංග නම් ජනකතා, ජනකවි, ජන ක්‍රීඩා, ජන ඇදහිලි, ජන ආගම්
ii. ජනශ්‍රැති අංගෝපාංගයන්ගෙන් තොරව නිර්මාණාත්මක සන්නිවේදනයක් නොමැති බව මානව විද්‍යාඥයින්ගේ අදහසයි.
iii. ග්‍රීක සාහිත්‍යයේ ඉලියඩ් හා ඔඩිසි, ඉන්දීය සාහිත්‍යයේ රාමායනය, මහා භාරතය, හිතෝපදේශය, පංචතන්ත්‍රය.
iv. පොදු ජනතාව
v. (අ) උන්නතිය - දියුණුව - සංවර්ධනය
(ආ) හිතෝපදේශය - හිතට උපදෙස් දීම

*(නිවැරදි උත්තරයකට ලකුණු 2 බැගිනි. i හා iii ප්‍රශ්න සඳහා එක් පිළිතුරක් පමණක් සපයා ඇත්නම් ල. 1 කි)*

5. ආකෘතිය (ලකුණු 5)
අන්තර්ගතය (ලකුණු 7)
ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 3)
(ලකුණු 15)

## III පත්‍රය

1. (i) (අ) සුර රජ සිට අහස
(ආ) තතක් සිඳින්න / වීණාවේ තතක් කඩන්න.
(ii) (අ) කේවට්ට බමුණා / කේවට්ටාචාරීන්
(ආ) වදින ලද පක්ෂය පරාජයත්, වැඳුම් ලැබූ පක්ෂයේ ජයග්‍රහණයත් තීරණය කිරීම
(iii)(අ) හිර ගෙදර අසලදී පුංචි මැණිකාට හමු වූ මහල්ලා
(ආ) බබුන්
(iv) (අ) උත්තර පංචාල නුවර චූලනී බ්‍රහ්මදත්ත රජතුමා
(ආ) එක් සියයක් රාජධානිවල රජවරු ඇතුළු අටලොස් අක්ෂෞහිණියක් සේනාව මියුළු නුවර වටලා ගෙන සිටියදී මියුලු නුවර වැසියන් සැණකෙළි පැවැත්වූ නිසා.
(v) (අ) දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා
(ආ) අඳුරේදී පඳුරකට මුවා වීම, අහසේ විදුලිය දැක ගිනිහුළ දියේ හෙළීම, අනුන්ගේ කාන්තාවන්ගේ හොඳ දැක තමන්ගේ බිරිඳට තැලීම.
(vi) (අ) කෝට්ටේ යුගය
(ආ) දෙවිවරුන් සහ ශක්‍රයා
(vii) (අ) මුඛ පරම්පරාගතව / කටින් කට
(ආ) ස්වාභාවික විපත්, ගොවිතැන් පාළු වීම් හා වසංගත රෝග නිවාරණය කර ගැනීමට
(viii) (අ) හිරපල්ලා / හිරගෙදර සිටි නිලධාරියා
(ආ) පුංචි මැණිකා / සිළිඳුගේ දුව / බබුන්ගේ බිරිඳ
(ix) (අ) මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමට
(ආ) මී පැණි සමග විලඳ කවා මී පැණි පොවා බෙහෙත් තෙලින් පියා සඟල පිරිමැද මොළොක් ඇතිරිලි අතුරන ලද රන් මැදිරියේ නිදි කරවා.
(x) (අ) සිතිවිලි නැති රූප වගේ
(ආ) මුහුණට මුහුණ හමු වී / මුණගැසී / සම්මුඛව

2. i (අ) අණ කිරීමක්, නියෝග කිරීමක්
විදින ලද ලිපියක් / තල් කොළ ලියුමක්
(ආ) අටලොස් අක්ෂෞහිණියක් සේනාව මියුළු නුවර වටලා යුද්ධෝපාය යෙදීමක් වශයෙන් කේවට්ටයාගේ උපදෙසින් මියුළු නුවර ජලය නවත්වන බව මහෞෂධ පඬිතුමාගේ චරපුරුෂයෙක් ඇතුළු නුවරට (මහෞෂධ පඬිතුමාට)ලිපියකින් දන්වූ අවස්ථාව.
ii (අ) මී මැසි සමූහයා
සාමාන්‍ය ස්වරූපයෙන්
(ආ) මඳ සන්සිඳුණු ස්වභාවයෙන් නොසැලී සිටි ඇත් සේනාව සිතියම්වල ඇතුන්ගේ ස්වභාවය ප්‍රකාශ කළේ ය.
iii (අ) බිස්ස - ගබඩාව
(ආ) ස්වාමි පුරුෂයා වූ බබුන් බොරු නඩුවකට සිරගත වීම, පියා වූ සිළිඳු මිනී මරා ජීවිතාන්තය දක්වා සිරගතවීම
iv (අ) ශරීරයේ ශක්තිය කඩුව / අසිපත
(ආ) ඕනෑම දෙයක් අවශ්‍ය වෙලාවට හැර වෙනත් වෙලාවකට ලැබුණොත් ප්‍රයෝජනයක් වන්නේ නැත.
v (අ) මහෞෂධ පඬිතුමාගේ සේනාවෝ තාප්පයට නැගී වැලි හා මඩවලින් ද ඊතල තෝමර ආදී දමා අනිත ආයුධවලින් කේවට්ටයන්ගේ සේනාව විනාශයට පත් කරන අවස්ථාවේදී එමෙන් ම තාප්පයට පිටින් දිය අගලක් වැලි අගලක් කලල් අගලක් තිබූ නිසා.
(ආ) මියුළු නුවර / මිථිලා රාජධානිය

3. උදාහරණයක් සඳහා ලකුණු 4
ප්‍රමාණවත් විස්තරයට ලකුණු 11 (ලකුණු 15)

4. උදාහරණයක් සඳහා ලකුණු 4
ප්‍රමාණවත් විස්තරයට ලකුණු 11 (ලකුණු 15)

5, 6, 7, උදාහරණ 3 ට ලකුණු 3
ප්‍රමාණවත් විස්තරයට ලකුණු 7 10 බැගින්